# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,974 — 1964 මාර්තු 6 වැනි සිකුරාද — 1964.3.6

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—ප්‍රළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 287 | තොටුපල් රේන්දු හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 293 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 294 | රථ බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 306 | විවිධ දැන්වීම ... ... ... | 306 |


[සැලකිය යුතුයි.—මේ වර ප්‍රසිඛ කරනු ලබන ගැසට් පත්‍රයේ V වෙනි කොටසේ "කුලී මෝටර් රථ සේවාවන්" පැවැත්වීම සඳහා මගින් ගෙනයාමේ අවසරපත් ඉල්ලීමේ අයැදුම් පත් ලැයිස්තුවක් පළ වේ.]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ, රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ; මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වනු මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" සි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත්, ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයේහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණ යකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කින් සමත්වීමටද ඔවුන්ට නියම වනු ඇත.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත්

ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූද, රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නොවන්නේ ය).

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලක රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු, ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පොත් බඳින්නකුගේ තනතුරක් සඳහා අයැදුම් පත් කැඳවනු ලැබේ. අයැදුම් පත් 1964 මාර්තු මස 23 වැනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය රුපියල් 750—42—රුපියල් 1,296 වෙයි. ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවල් කුලී, ජීවනාධාර හා විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

3. අයැදුම්කරුවන්—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතුයි;

(ආ) වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි අය විය යුතුයි;

(ඉ) අඩුම වශයෙන් සිංහල හා ඉංග්‍රීසි 7 වැනි ප්‍රමාණය තෙක් ඉගෙනුම ලබා සිටිය යුතුයි; හා

(ඊ) පොත් බැඳීම ගැන අවුරුදු 5 ක පළපුරුද්දක් සහ/හෝ ආණ්ඩුවේ මුද්‍රණාලයේදී හෝ වෙන යම් පිළිගත් මුද්‍රණාලය කදී පුහුණුවක් ලබා සිටිය් යුතුයි.

4. රාජ්‍ය සේවයේ නියුක්ත අයැදුම්කරුවන් තම අයැදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයැදුම් පත් ඉදිරිපත් කිරීමේදී එම අයැදුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදාලිය හැකි වේ දැයි ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුයි.

5. අයැදුම් පත් එවිය යුත්තේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්, කොළඹ 1, යන ලිපිනයට මිස මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් සෙසු නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ. සහතික පත්‍ර යනාදියෙහි පිටපත් පමණක් (මුල් ලියවිලි නොවේ) පළමුවෙන් ඉදිරිපත් කළ යුතු වේ.

6. අයැදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ආර්. සෙන්ට් එල්. පී. දුරනියගල,
නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්.

1964 පෙබරවාරි මස 28 වෙනි දින,
කොළඹ.

3–201/1—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහකාර පුස්තකාලයාධිපතිගේ තනතුර සඳහා අයැදුම් පත් කැඳවනු ලැබේ. එහි පාලන සහකාර තැනගෙන් ලබාගත හැකි නියමිත ඉල්ලුම් පත්‍ර අයැදුම්කරුවන් විසින් ලබාගෙන ඒවා සම්පූර්ණ කර 1964 මාර්තු මස 23 වැනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙනසේ එවිය යුතුයි.

2. මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය රුපියල් 1,680—120—රුපියල් 4,320 වෙයි. ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවල් කුලී, ජීවනාධාර හා විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

3. අයදුම්කරුවන්—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතුයි;

(ආ) වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි අය විය යුතුයි; හා

(ඉ) අඩුම වශයෙන් එකවර විෂයයන් තුනකින් සම්මාන සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථ්‍යය ලබා සිටිය යුතුයි.

ආර්. සෙන්ට් එල්. පී. දුරනියගල,
නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්.

1964 පෙබරවාරි මස 28 වෙනි දින,
කොළඹ.

3–201/2—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව—ප්‍රකාශන අංශය

### භාෂා පරිවර්තක තනතුර—සිංහල

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයට භාෂා පරිවර්තකයෙකු පත්කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මේ සඳහා එවන අයදුම්පත් පහත සඳහන් ආකෘතියට අනුව සම්පූර්ණ කොට 1964.3.20 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරේ වාර්ෂික වැටුප රුපියල් 3,900න් පටන් ගෙන වසකට රුපියල් 180 වාර්ෂික වැඩිවීම් 8කින් හා රු. 240 වාර්ෂික වැඩිවීම් 5කින් යුතුව රුපියල් 6,540 දක්වා නගී. රු. 5,340ට පෙර කාර්යක්ෂමතා කඩඉමෙකි.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුර සඳහා තෝරාගනු ලැබුවනු පත් කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත්වය.

4. අවශ්‍ය සුදුසුකම්—

(i) සෑම අයදුම්කරුවකුම 1964.3.6 වන දිනට වයස අවුරුදු 45ට වැඩි නො විය යුතුයි. (දැනට රජයේ සේවයේ නියුතු වූවන්ට මේ වයස් සීමාව බල නො පානු ඇත).

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත විය යුතු ය.

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු වියයුතු අතර උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් ගෙන් අඩු වශයෙන් දෙකකින් හෝ උපාධි තත්ත්වයේ දී සමත් විය යුතුය.

(iv) සිංහල පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.

(v) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ අවුරුදු 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති ශබ්ද කෝෂ සහායකයෝද අධ්‍යාපන සුදුසුකම් නොසලකා මේ තනතුරට ඉදිරිපත් වීමට සුදුස්සෝ වෙති.

5. රාජ්‍ය සේවයේ යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මේ තනතුරුවලට ඉල්ලුම්පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. ස්ථිර නිලධාරීන් සම්බන්ධයෙන් වූ විට ඉල්ලුම් පත් බාරගනු ලබන්නේ තෝරාපත් කරගත හොත් නිලධාරීන් සේවයෙන් මුදවාලීමට හැකි යයි දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කළොත් පමණි. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතු යයි නිර්දේශ නොකරතහොත් සලකා බලනු නො ලැබේ.

6. පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත නොවේ) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බවුතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා නිකුත් කරන ලද සහතික පත් හෝ භාරගනු නොලැබේ);

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා මේ තනතුරට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතකදී ලබා ගන්නා ලද සහතික දෙකක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ);

(ඈ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍රය;

(ඉ) සිංහලෙන් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික පත්‍රය.

7. අයදුම්පත් හා ඒ හා සම්බන්ධ සියළුම ලියකියවිලි මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකු ගේ පෞද්ගලික නමට නොව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, ප්‍රකාශන අංශය, තැ. පෙ. 520, අංක 5, ද පොන්සේකා පාර, කොළඹ 5 කියා එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡෙදයේ පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

9. සෑම අයදුම්පතක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයෙන් දින 7ක් ඇතුළත එවැනි දැන්වීමක් නොලත් අයදුම්කරුවකු වෙතොත් වහාම ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් තැනට දැනුම්දිය යුතුයි. එසේ නො කළහොත් ඔහුගේ අයදුම්පත ගැන සළකා බැලීමට ඇති යුතුකම නැතිවේ.

නන්දදේව විජේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 520, කොළඹ 5.

### රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සිංහල භාෂා පරිවර්තක ධූරය සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

1. සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරින්) :————.
   (අ) අගට යෙදෙන නම් :————.
   (ආ) වෙනත් නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. 1964.3.6 වැනි දිනට නිවැරදි වයස : අවුරුදු :——, මාස :——, දින :——.
4. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරුගේ :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.
   (ඉ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.
   (ඊ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ පියා :————.
6. ඉල්ලුම්කරු විවාහකද? එසේ නැත්නම් විවාහයෙන් පසු පුරුෂයා හෝ භාර්යාව මැරුණු අයෙක් ද? :————.
7. ඉගෙනීම කළ පාඨශාලා හා විද්‍යාලවල නම් (ඇතුළත් වූ දිනය හා අස් වූ දිනය සඳහන් කළ යුතුයි) :————.
8. උපාධියේ දී සමත් වූ විෂයයන් හා පන්තිය :————.
9. සිංහල භාෂාවෙන් ලැබූ උසස්ම සුදුසුකම් :————.
10. පරිවර්තන සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ දැනීමද, කෘතහස්ත භාවයද පිළිබඳ සම්පූර්ණ විස්තර :————.
11. පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර හා පත්වූ හා අස්වූ දින ද, ලැබූ වේතනය ආදියෙහි විස්තර :————.
12. විශේෂ සුදුසුකම් හෝ පුහුණුවීම්, එසේ නැතහොත් මේ සඳහා කිව හැකි වෙනත් කාරණා පිළිබඳ විස්තර :————.
13. අයදුම්කරු සම්බන්ධයෙන් වගකිව හැකි ඥාතීන් නොවන තුන් දෙනෙකුගේ නම්, තුරාතිරම හා ලිපිනය (මෙය පෞද්ගලික ජීවිතයේ අයදුම්කරු හොඳින් දන්නා අඳුනන අය විය යුතුයි. රාජ්‍ය සේවයෙහි නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය) :————.
14. වෙනත් කරුණු :————.

මේ අයදුම් පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියලුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීමෙන් පසුව, ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමිවී පදවියෙන් පහ කර දමනු ලැබීමට ද, හේතුවන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–170—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

ඇබෑර්තු

### තත්ත්ව පාලක සහකාරවරුන්

**අවශ්‍ය සුදුසුකම්.**—රසායන විද්‍යාව සහ උද්භිද විද්‍යාව/ජීව විද්‍යාව/ගණිතය යන විෂයයන්ගෙන් එකක් සමග උසස් පාඨශාලා සහතිකය හෝ ලංඩන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සහතිකය.

රසායනාගාරයක අඩු වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්දක් සහිතව රසායන විද්‍යාව සහ උද්භිද විද්‍යාව/ජීව විද්‍යාව/ගණිතය යන විෂයයන් එකකින් සම්මාන සාමාර්ථය ඇතුලුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

**වේතනය**—මෙම තනතුරට අදාල පඩි ක්‍රමය අවුරුද්දකට :

රුපියල් 1,860—රුපියල් 3,780

16 × 120

තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ගේ පරීක්ෂණ/අත්හදබැලීම් කාලය අවුරුදු තුනක් වේ. රජයේ භාෂා ප්‍රතිපත්තියට සහ විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත් ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීම සඳහා දැනට සකස් කර ඇති නීතියේ හෝ මින් පසුව පිළියෙල කරන නීතිවලට හෝ අනුකූලව ඔවුන් ක්‍රියාකළ යුතුවේ.

තෝරාගනු ලබන අපේක්ෂකයින් වාලච්චනේ හෝ කොළඹ නැවතී වැඩ කිරීම අවශ්‍ය වේ.

අමතර දීමනාවන් සංයුක්ත මණ්ඩලයේ ගණන් අනුව ගෙවන අතර එකී දීමනාවන් දැනට රජය විසින් ගෙවනු ලබන ප්‍රමාණයන්ම වේ.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම මගින් ඉල්ලුම්කරුවන්ගේ අත්අකුරින්ම 1964 මාර්තු 16 වැනිද හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනය ඇතිව සභාපතිවරයා නමට ලැබෙනසේ ඉල්ලුම් පත් එවිය යුතුයි. ඉල්ලුම් පත් පෝර්ම තැපැලෙන් ඉල්ලා එවන විට මුද්දර ගැසූ, සිය ලිපිනය සහිත කවරයක්ද එවිය යුතුයි.

සභාපති,
නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

කැ.පෙ. 1367,
කොළඹ 1,
1964.2.24.

2–945—64.3.6 දින අංක 13.974 දරන ගැසට් පත්‍රය

## ලංකා වානේ සංස්ථාව

### පිරිස් සහකාර තනතුරු ඇබෑර්තුව

ලංකා වානේ සංස්ථාව පිරිස් සහකාර තනතුරක් සඳහා ලාංකික යන්ගෙන් අයැදුම් පත් කැඳවයි.

**සුදුසුකම් :** අයැදුම්කරුවන්—

(1) 1964 මාර්තු 21 දිනට වයස අවුරුදු 40 ට වැඩි නොවිය යුතුයි.

(2) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධිධරයෙක් විය යුතුයි.

වැටුප්.—තෝරාගත් අපේක්ෂකයා රුපියල් 500—15×20—800 යන සියල්ල අඩංගු මාසික වැටුප් පරිමාණයේ සුදුසු ස්ථානයක පිහිටුවනු ඇත.

අයැදුම් පත්.—වයස, අධ්‍යාපනය, පළපුරුද්ද ආදී විස්තර ඇතුළත් අයැදුම් පත් අතුරුගිරියේ ලංකා වානේ සංස්ථාවේ සභාපති වෙත 1964 මාර්තු 21 දින දහවල් 1 ට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි.

ලියුම් කවරයේ 'පිරිස් සහකාර තනතුර' යන්න යෙදිය යුතුයි.

රජයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩලවල සේවකයින් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයැදුම් පත් එවිය යුතුයි.

3-211/1—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ලංකා වානේ සංස්ථාව

### තනතුරු ඇබෑර්තු

1. විද්‍යුත් කරුවන්
2. වැල්ඩිම්කරුවන්
3. වැද්දුම්කරුවන්
4. බෙලෙක් වැඩකරුවන්
5. මිකැනික්වරු (භාරත යන්ත්‍ර ආදිය අළුත්වැඩියා කිරීමේ පළපුරුද්ද ඇති).
6. ක්‍රියාකරුවන් (දෙබිකර, භාරත යන්ත්‍ර, බුල්ඩෝසර් ආදිය).

ලංකා වානේ සංස්ථාව ඉහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන් ගෙන් අයැදුම්පත් කැඳවයි.

**සුදුසුකම්.**—අයැදුම්කරුවනට යටත් පිරිසෙයින් ඉහත සඳහන් වෘත්තියය අවුරුදු 5ක පළපුරුද්දක් ඇතිවීම.

වැටුප්.—සුදුසුකම් අනුව තෝරාගත් අපේක්ෂකයින් පහත සඳහන් සියල්ල අඩංගු මාසික වැටුප් පරිමාණවල සුදුසු තන්හි පිහිටුවනු ලැබේ:—

(1) රුපියල් 130—15 × 2—160.
(2) රුපියල් 140—15 × 3—185.
(3) රුපියල් 165—15 × 5—240.
(4) රුපියල් 200—15 × 7—305.

අයැදුම්පත්.—වයස, අධ්‍යාපනය, පුහුණුව හා පළපුරුද්ද ආදිය පිළිබඳ විස්තර ඇතුළත් අයැදුම් පත් අතුරුගිරියේ, ලංකා වානේ සංස්ථාවේ සභාපති වෙත 1964 මාර්තු 21 දින ප. ව. 1ට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි.

ලියුම් කවරයේ 'පුහුණු කම්කරු තනතුර' යන්න සඳහන් විය යුතුයි.

රජයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩලවල සේවකයින් අයැදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුයි.

3-211/2—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ලංකා වානේ සංස්ථාව

### (ෆෝර්මන්) වැඩනායක තනතුරු—ඇබෑර්තු

ලංකා වානේ සංස්ථාව වැඩනායක තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයැදුම් පත් කැඳවයි.

**සුදුසුකම් :**—

(1) 1964 මාර්තු 21 වන දිනට වයස අවුරුදු 45 ට අඩුවීම;

(2) කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය හෝ සමාන සහතිකයක් තිබීම (යාන්ත්‍රික හෝ විද්‍යුත්);

(3) යටත් පිරිසෙයින් අවුරුදු 5ක හෝ සුපරීක්ෂක පළපුරුද්දක් තිබීම.

වැටුප්.—සුදුසුකම් හා පළපුරුද්ද අනුව තෝරාගත් අපේක්ෂකයින් පහත දක්වෙන සියල්ල අඩංගු මාසික වැටුප් පරිමාණවල සුදුසු තැන්හි පිහිටුවනවා ඇත:—

(1) රු. 400—15 × 15—625.
(2) රු. 500—15 × 20—800.

අයැදුම්පත්.—වයස, අධ්‍යාපනික සුදුසුකම්, කාර්මික පුහුණුව හා පළපුරුද්ද අඩංගු විස්තර ඇතුළත් අයැදුම් පත්, අතුරුගිරියේ ලංකා වානේ සංස්ථාවේ සභාපති වෙත 1964 මාර්තු 21 වන සෙනසුරාද දහවල් 12ට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි.

අයැදුම්පත් එවනු කවරයේ "වැඩනායක තනතුර" යන්න සඳහන් විය යුතුයි. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවල හෝ සේවකයින් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයැදුම් පත් එවිය යුතුයි.

3-211/3—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ලංකා වානේ සංස්ථාව

### සහකාර ගණකාධිකාරි තනතුර

ලංකා වානේ සංස්ථාව සහකාර ගණකාධිකාරි තනතුරක් සඳහා ලාංකිකයන්ගෙන් අයැදුම්පත් කැඳවයි.

**සුදුසුකම් :** අයැදුම්කරුවන්—

(1) 1964 මාර්තු 21 දිනට වයස අවුරුදු 40 ට වැඩි නොවිය යුතුයි.

(2) පිරිවැය හෝ මුදල් ගණකාධිකාරීන්ගේ ආයතනයේ මධ්‍යම විභාගය සමත් විය යුතුයි.

වැටුප්.—තෝරාගත් අයැදුම්කරු රුපියල් 625—15 × 25—1,000 යන සියල්ල අඩංගු මාසික වැටුප් පරිමාණයේ සුදුසු ස්ථානයක පිහිටුවනු ඇත.

අයැදුම් පත්.—වයස, අධ්‍යාපනය, පළපුරුද්ද ආදී විස්තර ඇතුළත් අයැදුම් පත් අතුරුගිරියේ ලංකා වානේ සංස්ථාවේ සභාපති වෙත 1964 මාර්තු 21 දින දහවල් 1 ට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි.

ලියුම් කවරයේ 'සහකාර ගණකාධිකාරි තනතුර' යන්න යෙදිය යුතුයි.

රජයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩලවල සේවකයින් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයැදුම් පත් එවිය යුතුයි.

3-211/4—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## ලංකා වානේ සංස්ථාව

### කණිෂ්ඨ වැඩනායක තනතුරු—ඇබෑර්තු

ලංකා වානේ සංස්ථාවේ කණිෂ්ඨ වැඩනායක තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයැදුම් පත් කැඳවයි.

**සුදුසුකම් :—**

අයැදුම්කරුවන්—

(1) 1964 මාර්තු 21 වන දිනට වයස අවුරුදු 40ට අඩුවීම ;

(2) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ සමාන විභාගයක සාමාර්ථය ;

(3) පහත සඳහන් එක් වර්ගයකින් යටත් පිරිසෙයින් අවුරුදු 5ක ආධුනිකත්වයක් හෝ පළපුරුද්දක් ඇතිවීම :—

(අ) සේවා.—බර වාත සම්පීඩකයන් (කොම්ප්‍රෙසර්ස්), සීත කරන යන්ත්‍රාගාර, ජල සැපයුම් හා ජල ප්‍රවාහණ නිර්මාණ, ඉන්ධන තෙල් ගබඩා කිරීම්, හා බෙදා හැරීමේ පහසුකම් කර්මාන්ත පයිප්ප වැඩ හා වාෂ්ප යන්ත්‍රාගාර නඩත්තුව හා සේවා කිරීම ;

(ආ) විද්‍යුතික.—උප-විදුලි ස්ථාන වැඩ, ස්විච් ගියර් ඇතුළු බර විදුලි යන්ත්‍ර සිටුවීම, පරීක්ෂා කිරීම නඩත්තුව හා අළුත්වැඩියාව, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ වැඩ ;

(ඇ) වැඩහළට.—යන්ත්‍ර වැඩහල් පුහුණුව, සවිකිරීම හා කොටස් එකලස් කිරීම, නළ සවිකිරීම හා ජලනළ වැඩ ලෝහ කොළ කොටස් ගැලපීම, විද්‍යුතික හා වායු වෑල්ඩිම් වැඩ, වාත්තු නල හා කම්හල් වැඩ.

**වැටුප්.**—සුදුසුකම් හා පළපුරුද්ද අනුව තෝරාගන්නා අපේක්ෂක යන් පහත දක්වෙන සියල්ල අඩංගු මාසික වැටුප් පරිමාණවල සුදුසු තන්හි පිහිටවනු ඇත :—

(අ) රු. 320—15 × 12—500.

(ආ) රු. 400—15 × 15 —625.

**අයදුම් පත්‍ර.**—වයස, අධ්‍යාපනික සුදුසුකම්, කාර්මික පුහුණුව හා පළපුරුද්ද අඩංගු විස්තර ඇතුළත් ඉල්ලුම් පත්, අතුරුගිරියේ ලංකා වානේ සංස්ථාවේ සභාපති වෙත 1964 මාර්තු 21 වන දින දහවල් 12ට පෙර ලැබෙන සේ එවිය යුතු ය.

අයැදුම්පත් එවන කවරයේ වම් කෙළවර මුදුනෙහි " කණිෂ්ඨ වැඩ නායක " යන්න යෙදිය යුතු ය. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවල සේවකයින් තමන්ගේ අයදුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු ය.

3–211/5—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### නාවික ඉංජිනේරු සහකාර තනතුර

කොළඹ ධීවර දෙපාර්තමේන්තුවේ නාවික ඉංජිනේරු සහකාර තනතුර සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම් පත් 1964 මාර්තු 27 වැනි දිනට හෝ ඊට පෙර මට ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. **වැටුප්.**—මේ තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය.—වර්ෂයකට රු. 2,580 (පුහුණුව ලබන අවුරුදු 2 තුළ දී) පුහුණුව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු වර්ෂයකට රු. 3,300—120 හා 180—රු. 5,340.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මේ තනතුරු ස්ථිර, විශ්‍රාම වැටුප් හිමි ඒවාය. මේ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් පළමුකොට අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්ව පත් කරනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) 1964.3.6 වැනිදාට වයස අවුරුදු 25ට නො අඩු බවට හා 40 ට වැඩි නො වන බවට.

(ii) පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ දිවා ඩිප්ලෝමා උපාධිය,

(ආ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරී සහතිකය හෝ ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඩිප්ලෝමා උපාධිය හෝ ඊට සමාන සුදුසුකම්, සහ

(ii) එවැනි සහතිකයක් හෝ ඩිප්ලෝමා උපාධිය හෝ ලැබීමෙන් පසු පිළිගත් ඉංජිනේරු වැඩ පළක වැඩ පිළිබඳ අවුරුදු 5 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා සිටීම,

නැතහොත්

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ සැන්දෑ ඉංජිනේරු සහතිකය සහ පිළිගත් ඉංජිනේරු වැඩ පිළිබඳ අවුරුදු 10ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබාසිටීම. ලන්ඩන් හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ඉන්ස්ටිටියුට් හි කාර්මික විද්‍යා පිළිබඳ සහතික සහ පිළිගත් ඉංජිනේරු වැඩ පළක වැඩ පිළිබඳව අවු. 10ක පළපුරුද්ද වැනි විකල්ප සුදුසුකම් ලබා සිටීම,

නැත්නොත්

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් හෝ සහතික පත්‍රයක් සහ පිළිගත් වැඩ පළක 8 අවුරුද්දකට නොඅඩු කාලයක් පරිපාලන තත්ත්වයක ගතකරන ලද ආධුනික කාලය ඇතුළු අවුරුදු 15ක පළපුරුද්දක් ලබා සිටීම.

5. අයදුම්කරුවන් විසින් අයදුම්පත් සමග පහත සඳහන් සහතික පිටපත් ද (මුල් සහතික නොවේ) එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතික හෝ උපක්‍රෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත් බාර ගනු නොලැබේ.)

(ii) අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) ළඟදී ලබාගත් චරිත සහතික තුනක්.

6. අයදුම්පත් හෝ ඒවාට සම්බන්ධ ඕනෑම ලියවිල්ලක් එවිය යුත්තේ, ධීවර අධ්‍යක්ෂ යන පදවි ලිපිනයට විනා දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධාරියකුගේ පුද්ගලික නමට නොවේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
වැඩ බලන ධීවර අධ්‍යක්ෂ.

1964, මාර්තු මස,
කොළඹ 3, තැපැල් පෙට්ටිය 531,
ධීවර දෙපාර්තමේන්තුවේදීය.

### අයදුම් පත් ආකෘති පත්‍රය

#### නාවික ඉංජිනේරු සහකාර තනතුර

1. සම්පූර්ණ නම :—
   පෙළපත් නාමය :————.
   අනික් නම් :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. 1964.3.6 වැනිදාට වයස :————.
5. උපන් දිනය (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.
6. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා :————.
7. විවාහකද අවිවාහකද යන වග :————.
8. අධ්‍යාපනික සුදුසුකම් : සමර්ථ වූ ප්‍රසිද්ධ විභාගයන්ගේ දිනයන් සහ අන්තිමට සමර්ථ වූ ප්‍රසිද්ධ විභාගයේදී ගත් විෂයයන් සඳහන් කරන්න. (ඉහළම විභාගයේ සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
9. ඇත්වීමේ 4 (ආ) ඡේදයේ සඳහන් සුදුසුකම් වලින් ඔබට ඇත්තේ කුමණ සුදුසු කමක්ද ? ඒ සුදුසුකම් සනාථ කිරීමට සහතික ඇමිණිය යුතුයි :————.
10. කාර්මික සහ වෘත්තීය සුදුසුකම්, විභාගයේ දින හෝ පුහුණුව සම්පූර්ණ කළ දිනය :————.
11. අධ්‍යාපනය අවසාන කළායින් පසු කළ රක්ෂා පිළිබඳ දින සහිත විස්තර :————.
12. දැනට කරන රක්ෂාව සහ වැටුප :————.
13. ඉල්ලුම්කරු පුද්ගලික වශයෙන් දන්නා තැනැත්තන් දෙදෙනෙකුගේ නම්, පදවි සහ ලිපිනයක්, මේ අයගෙන් චරිත සහතික නොලබා තිබිය යුතුයි :————.
14. චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන් (එසේ ලබාගත් චරිත සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) : ————.
15. යුද්ධ හමුදාවේ සේවය කර තිබේ නම්, සේවය කළ කාලය : ————.
16. තනතුර සඳහා ඇති විශේෂ හිමිකම් :————.

————,
අත්සන.

දිනය :————.
කොළඹ, තැපැල් පෙට්ටි 531,
ධීවර අධ්‍යක්ෂ වෙත්ය.

3–123—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## සමුපකාර තොග වෙළඳ සංසථාව

### උප ගබඩා පාලකවරුන්ගේ ඇබෑර්තු

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ උප ගබඩා පාලකවරුන්ගේ ඇබෑර්තු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**පඩි ක්‍රමය.**—මසකට රු. 86—6—236 සහ රජයේ ගෙවීම් අනුව දීමනා.

ඉල්ලුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය පෙල) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් සාමාර්ථය ලැබූ රජයේ දෙපාර්තමේන්තුවක හෝ වෙළඳ ආයතනයක අවුරුදු දෙකක ගබඩා පාලන පිළිබඳව පළපුරුද්දක් ඇති අය විය යුතුය. තෝරාගනු ලබන අය විසින් මුදලින් රු. 1000 ක ඇපයක් තැබිය යුතුය.

1964.3.17 දිනට වයස අවුරුදු 40 ට අඩුවිය යුතුයි. වයස අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද සඳහන් ඉල්ලුම්පත්‍ර, ළඟදී ලැබුන චරිත සහතික පිටපත් දෙකක්ද සමග 1964.3.17 වෙනි දිනට පෙර කවරයේ උඩ වම් කෙළවරේ "උප ගබඩා පාලක" යනුවෙන් ලියා සාමාන්‍යාධිකාරි තැන ස:තො:ස: මූලස්ථානය, අංක 21, වැක්ෂෝල් වීදිය, කොළඹ 2. කියා එවිය යුතුයි.

ආර්. ඇම්. බී. සේනානායක,
සාමාන්‍යාධිකාරී වෙනුවට.

1964.3.26,
සමුපකාර තොග වෙළඳ සංසථාව,
වොක්ෂෝල් වීදිය අංක 21,
කොළඹ 2.

3–44—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

### සහකාර ගණකාධිකාරි තනතුරු සඳහා පුරප්පාඩු

සහකාර ගණකාධිකාරි තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අවුරුදු 30 ට අඩු නම් වඩා මැනවි.

**සුදුසුකම්.**—අයදුම්කරුවන් වරලත් ගණකාධිකාරී (ලංකා) ආයතනයේ මධ්‍ය පරීක්‍ෂණයෙන් සාමාර්ථය හෝ සමාන සුදුසුකම් ලබා සිටිය යුතුය.

**වැටුප් ක්‍රමය ආදිය.**—(i) සුදුසුකම් හා පළපුරුද්ද අනුව, වර්‍ෂයකට රු. 4,800—360—රු. 8,400 ක මූලික වැටුප් ක්‍රමය ඇතුළත සුදුසු වැටුපකට පත් කරනු ඇත.

(ii) ජීවන වියදම්, විශේෂ ජීවනාධාර සහ ගෙවල් කුලී දීමනා නියමිත ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

අයදුම්පත් බාර ගන්නා අන්තිම දිනය 1964 මාර්තු 25.

වැඩිදුර විස්තර සහ අයදුම්පත් ෆෝර්ම පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රධාන සේවා මණ්ඩල නිලධාරි,
ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1382,
නො. 287, ගාලු පාර,
කොළඹ 3.

1964 පෙබරවාරි 28.

3–213—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ගල්ඔය සංවර්ධන මණ්ඩලය

ගල්ඔය සංවර්ධන මණ්ඩලය යටතේ පාලනය වන උඩ වලවේ යෝජනා ක්‍රමයේ ප්‍රධාන ගණකාධිකාරි ධුර්‍ය සඳහා පහත් සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන් ගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ :—

**සුදුසුකම්.**—වරලත්, සංසථා බලලත් ගණකාධිකාරි හෝ එවැනි සුදුසුකම් සහිතව රජයේ දෙපාර්තමේන්තුවක, සංයුක්ත මණ්ඩලයක හෝ විශාල වෙළඳ ආයතනයක පස් අවුරුද්දකට වැඩි ප්‍රායෝගික පළපුරුද්දක් ඇති ගණකාධිකාරවරයෙකු විය යුතුය. ඔහුට සිංහල ගැන මනා දැනුමක් ඇති විය යුතුය.

**වයස.**—අවුරුදු 35-50 අතර විය යුතුය.

**වැටුප් ක්‍රමය.**—රු. 13,200—(450 ක් සහ 600—6 ක්) රු. 18,600—රු. 19,200—600—රු. 21,000 වාර්ෂික වැටුපක් ගෙවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම් කරුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු ලක්ෂ්‍යයක වැටුප නියම කිරීමට හැකි වෙනවා ඇත.

ඉහත සඳහන් වැටුපත් සමග රජයේ අනුමත ප්‍රමාණයක් අනුව ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ. නිවාස පහසුව සලසන්නේ නැති නම් විවාහකයෙකුට මූලික වැටුපෙන් 15% සහ අවිවාහකයෙකුට මූලික වැටුපෙන් 7½% ක් ගෙවල් කුලී දීමනා වශයෙන් ගෙවනු ලැබේ.

මේ තනතුර සඳහා වැඩි විස්තර සහ ඉල්ලුම් පත්‍ර ආකෘති කොළඹ 7, බුලර්ස් පාරේ අංක 415 දරණ ස්ථානයේ ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්‍යාලයේ උඩ වලවේ සාමාන්‍යාධිකාරිවරයා ගෙන් ලබා ගැනීමට පුලුවන.

1964 මාර්තු මස 25 දින ඉල්ලුම් පත්‍ර භාර ගැනීම අවසාන කරනවා ඇත.

සාමාන්‍යාධිකාරී,
උඩ වලවේ,
ගල්ඔය සංවර්ධන මණ්ඩලය.

1964 පෙබරවාරි මස 28 දින,
කොළඹ දීය.

3–253/1—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ගල්ඔය සංවර්ධන මණ්ඩලය

ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ උඩ වලවේ බහු කාර්‍ය ජලාශ යෝජනා ක්‍රමය යටතේ පහත සඳහන් ඇබෑර්තු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ:—

1. **සහකාර ඉංජිනේරු :**

**අවශ්‍ය සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක බී.ඇස්.සී. (ඉංජිනේරු) උපාධිධරයකු හෝ ඒ.ඇම්.අයි.සී.ඊ. පළමු හා දෙවන කොටසින් සමර්ථය ලද්දකු විය යුතුයි.

**වයස.**—අවුරුදු 25—40 අතර විය යුතුයි.

වැටුප්.—සංවර්ධන මණ්ඩලයේ වැටුප් ක්‍රමය අනුව රු. 5,760—240—රු. 7,240 වාර්ෂික වැටුපක් ගෙවනු ලැබේ.

2. **සැළසුම්කරුවන්.**—ලංකා කාර්මික විද්‍යාලයේ (සැලසුම්කරුවන්ගේ පංතියේ) සම්පූර්ණ කාලීන පාඨමාලාව අවුරුද්දක් හදාරා සාමාර්ථය ලද අය හෝ, පිළිගත් ඉංජිනේරු හෝ ගොඩනැගිලි නිර්මාන සමාගමක අවුරුද්දක් නවකයෙකු වශයෙන් සේවය කර ඇති ඉහත සඳහන් විභාගයට සමාන විභාගයකින් සාමාර්ථය ලද (උදාහරණයක් : මිනින්දෝරු සැලසුම්කරු) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා පිළිගත් ඉංජිනේරු හෝ ගොඩනැගිලි නිර්මාන සමාගමක සැලසුම්කරුවෙකු වශයෙන් පස් අවුරුද්දක්ද සේවය කල අයවිය යුතුය.

**වයස.**—අවුරුදු 20—45 අතර විය යුතුයි.

වැටුප්.—පළපුරුද්ද සහ සුදුසුකම් අනුව රු. 1,200—72—1,920 හෝ රු. 2,040—120—රු. 3,480 වාර්ෂික වේතනයක් ගෙවනු ලැබේ.

ඉහත සඳහන් වැටුපට අමතරව, ආණ්ඩුවේ ගෙවීම් අනුව ජීවනාධාර ගෙවනවා ඇත. නිවාස පහසුකම් සලස්වන්නේ නොමැතිනම් විවාහක අයෙකුට මූලික වැටුපෙන් 15% ක් ගෙවල් කුලී දීමනාවක් ගෙවන අතර අවිවාහකයෙකු නම් මූලික වැටුපෙන් 7½% ක ගෙවල් කුලී දීමනා ගෙවනු ලැබේ.

මේ තනතුර සඳහා විස්තර සහ ඉල්ලුම් පත්‍ර ආකෘති කොළඹ 7, බුලර්ස් පාරේ අංක 415 දරණ සථානයෙහි පිහිටි ගල්ඔය සංවර්ධන මණ්ඩල කාර්යාලයෙන් ලබාගත හැක. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1964 මාර්තු 20 වෙනි දිනය.

සාමාන්‍යාධිකාරි,
උඩ වලවේ,
ගල්ඔය සංවර්ධන මණ්ඩලය.

1964 පෙබරවාරි මස 24 දින.

3–253/2—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### කණිටු මුදල් අයකැමියන්ගේ ඇබෑර්තු

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ කණිටු මුදල් අයකැමි ඇබෑර්තු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

පඩි ක්‍රමය : මසකට රු. 74—6—140 සහ රජයේ ගෙවීම අනුව දීමනා.

ඉල්ලුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය/සාමාන්‍ය පෙළ දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් සාමාර්ථය ලැබූ රජයේ දෙපාර්තමේන්තුවක හෝ වෙළඳ ආයතනයක අවුරුදු දෙකක මුදල් අයකැමියෙකු වශයෙන් පළපුරුද්දක් ඇති අය විය යුතුය.

64.3.17 දිනට අවුරුදු 40ට අඩුවිය යුතුය.

තෝරාගත් අයැදුම් කරුවන් ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට සූදානම් විය යුතු අතර වැඩ භාරගැනීමට පෙර මුදලින් රු. 750 ඇපයක් තැබිය යුතුය.

වයස, අධ්‍යාපන සුදුසුකම්, සහ පළපුරුද්ද සඳහන් ඉල්ලුම් පත්‍ර, ලඟදී ලැබුන චරිත සහතික පිටපත් දෙකක්ද සමඟ 64.3.17 වෙනි දිනට පෙර කවරයේ වම් කෙළවරේ "කණිටු මුදල් අයකැමි" යනුවෙන් ලියා සාමාන්‍යාධිකාරි, සතො. මූලස්ථානය, අංක 21, වැක්ෂෝල් වීදිය, කොළඹ 2 කියා එවිය යුතුය.

වී. ඒ. ජේ. සේනාරත්න,
සාමාන්‍යාධිකාරි තැන.

සතොස මූලස්ථානය,
පාලන අංශය,
1964.3.2.

සමුපකාර තොග වෙළඳ සංස්ථාව,
නො. 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 2.

3–227—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

එස්. ධර්මදාස මෙනෙවිය සහ ඩී. බී. ඇල්ලේපොල, සී. ඊ. ඒ. ගුණසේකර සහ ජේ. පැට්‍රික් යන මහතුන් 1963 අගෝස්තු මාසයේදී ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා පවත්වන ලද ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වූ බව නිවේදනය කරමි.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1963 පෙබරවාරි මස 25 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැපැල් පෙට්ටි අංකය 573,
කොළඹ.

3–25/1—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

කේ. සින්නතම්බි මහතා 1963 අගෝස්තු මාසයේදී ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා පවත්වන ලද දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වූ බව නිවේදනය කරමි.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 පෙබරවාරි මස 25 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැපැල් පෙට්ටි අංකය 573,
කොළඹ.

3–25/2—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ජාතික කලායතනයේ සංගීතය, උඩරට හා පහතරට නැටුම් පිළිබඳ බාහිර විභාගය

ශ්‍රී ලංකා ජාතික කලායතනයේ සංගීතය, උඩරට හා පහතරට නැටුම් පිළිබඳ බාහිර විභාගය සඳහා අපේක්ෂකයින් ඉදිරිපත් කිරීමට අදහස් කරන ගුරුවරුන් හා ආයතනයන් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු බව දන්වමි.

2. මෙම විභාගයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කොටස් 1964 වර්ෂයේ ඔක්තෝබර් මස දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 1963 දක්වා පැවැත්වුණු පෙරදිග සංගීතය හා නැටුම් පිළිබඳ විභාගය වෙනුවට මෙම විභාගය පැවැත්වෙන බව සැළකිය යුතුයි.

3. මෙම විභාගය සඳහා අපේක්ෂකයින් ඉදිරිපත් කිරීමට අදහස් කරන ගුරුවරුන් හා ආයතනයන් පහත සඳහන් ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 46 දරණ තැන ශ්‍රී ලංකා ජාතික කලායතනයේ ලේඛකාධිකාරි මහතා වෙත 1964.3.31 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු යි.

4. සංගීත හා නැටුම් උපදේශක වරුන් සේවය කරන රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත විද්‍යාල ඉහත සඳහන් පරිදි ලියා පදිංචි වීම අවශ්‍ය නො වේ.

5. මෙම විභාගයට අදාළ නිර්දේශ පත්‍ර, ව්‍යවස්ථා හා අයදුම් පත් යථා කාලයේදී කොළඹ 2, මැලේ වීදියේ, ශ්‍රී ලංකා විභාග කොමසාරිස් තුමාගෙන් ලබාගත හැක.

### ආකෘති පත්‍රය

### ශ්‍රී ලංකා ජාතික කලායතනයේ සංගීතය, උඩරට හා පහතරට නැටුම් පිළිබඳ බාහිර විභාගය—ලියා පදිංචි වීමේ ඉල්ලුම් පත්‍රය

1. ආයතනයේ/ගුරුවරයාගේ නම : ..............................................

2. ලිපිනය : ..............................................
..............................................
..............................................

3. ආයතනයක් නම් ප්‍රධානාචාර්ය
වරයා ගේ නම : ..............................................

4. ආයතනය/ගුරුවරයා ඉගැන්වීම
ආරම්භ කළ වර්ෂය..............................................

5. දැනට ලේඛනයේ සිටින වයස
16 න් වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව :..............................................

6. දැනට සිටින ගුරු මණ්ඩලය :..............................................

| | ගුරුවරයාගේ නම | ස්ථිර/තාවකාලික | සුදුසුකම් | ඉගැන්වීමේ පළපුරුද්ද |
|---|---|---|---|---|
| (අ) | .................. | .................. | ............ | .................. |
| (ආ) | .................. | .................. | ............ | .................. |
| (ඇ) | .................. | .................. | ............ | .................. |
| (ඈ) | .................. | .................. | ............ | .................. |
| (ඉ) | .................. | .................. | ............ | .................. |
| (ඊ) | .................. | .................. | ............ | .................. |
| (උ) | .................. | .................. | ............ | .................. |
| (ඌ) | .................. | .................. | ............ | .................. |

7. පෙරදිග සංගීතය හා නැටුම් විභාගයේ ප්‍රථම, මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා පසුගිය දෙ වර්ෂය තුළ ඉදිරිපත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව හා ප්‍රතිඵල—

| | ප්‍රථම | මධ්‍යම | අවසානය |
|---|---|---|---|
| අ : සංගීතය— | | | |
| (i) 1962 ඉදිරිපත්කළ ගණන | ............ | ............ | ............ |
| සමත් ගණන | ............ | ............ | ............ |
| (ii) 1963 ඉදිරිපත් කළ ගණන | ............ | ............ | ............ |
| සමත් ගණන | ............ | ............ | ............ |
| ආ : උඩරට නැටුම්— | | | |
| (i) 1962 ඉදිරිපත් කළ ගණන | ............ | ............ | ............ |
| සමත් ගණන | ............ | ............ | ............ |
| (ii) 1963 ඉදිරිපත් කළ ගණන | ............ | ............ | ............ |
| සමත් ගණන | ............ | ............ | ............ |
| ඇ : පහතරට නැටුම්— | | | |
| (i) 1962 ඉදිරිපත් කළ ගණන | ............ | ............ | ............ |
| සමත් ගණන | ............ | ............ | ............ |
| (ii) 1963 ඉදිරිපත් කළ ගණන | ............ | ............ | ............ |
| සමත් ගණන | ............ | ............ | ............ |

8. සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබන ආයතනයක් නම් එම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි අංකය :..............................................

2–136—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

ජාතික පුස්තකාල හා ප්‍රලේ...

## රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයට ශිෂ්‍යයින් බඳවා ගැනීම

මෙම ආයතනයට ශිෂ්‍යයින් බඳවා ගැනීම සඳහා, 1964 මැයි මස 9 වෙනි දින පවත්වනු ලබන පරීක්ෂණය සඳහා විස්තර පත්‍රිකා 1964 අප්‍රියෙල් මස 4 වෙනි දින දක්වා පමණක් නිකුත් කරනු ලැබේ. අවශ්‍ය ඉල්ලුම් පත් 1964 අප්‍රියෙල් මස 11 වෙනි දින දක්වා පමණක් නිකුත් කරනු ලබන බවත්, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1964 අප්‍රියෙල් මස 18 වෙනි දින දක්වා පමණක් භාරගන්නා බවත්; විභාගාපේක්ෂකයින් වෙත මෙයින් දැනුම් දෙමි. 1964 අප්‍රියෙල් මස 18 වෙනි දිනෙන් පසුව මෙම ආයතනයට ලැබෙන ඉල්ලුම් පත් භාර නොගන්නා බව විශේෂයෙන් සඳහන් කරමි.

කොන්දේසි ආදිය පහත සඳහන් වේ.

වැඩි විස්තර සඳහා මෙම ආයතනයේ වැඩබලන ප්‍රධාන ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

ඇල්. එච්. සුමනදාස,
වැඩබලන ප්‍රධාන ඉංජිනේරු තැන.

මූලික කාර්මික අභ්‍යාස ආයතනය,
රත්මලාන, 1964.2.29.

### සුදුසුකම් හා ව්‍යවස්ථා

1. (අ) ශිෂ්‍යයින් බඳවා ගැනීමේ දිනය වන 1964 ජූලි මස 1 වෙනි දිනට වයස අවුරුදු 15 ටත් 16 ටත් අතර විය යුතුයි.
(ආ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි අටවෙනි ප්‍රමාණයෙන් සමත්ව සිටිය යුතුයි.
(ඇ) මෙම ආයතනයේ උපදෙස් දෙනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් බැවින් ඔවුන් ඒ වැඩ කිරීම සඳහා සිංහල දැනුමක් ඇතිව සිටිය යුතුයි.
(ඈ) උස අඩි 4 කුත් අඟල් 8 ක් හෝ ඊට වැඩිවිය යුතුයි.
(ඉ) පපුව (නොපිහිදා) අඟල් 27 ක් හෝ ඊට වැඩිවිය යුතුයි.
(ඊ) ඇස් පෙනීම ආදී ශරීර සුවයෙන් සිටිය යුතුයි.
(උ) ඉතා යහපත් කල් ක්‍රියාවෙන් යුක්ත විය යුතුයි.

2. ඉහත සඳහන් සුදුසුකම්වලින් සම්පූර්ණ අයට පමණක් පහත සඳහන් ලිවීමේ පරීක්ෂණයට, තම භාෂා මාධ්‍යයෙන් පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :—
(අ) සාමාන්‍ය ගණිතය (අටවෙනි ප්‍රමාණයට සුදුසු අන්දමට).
(ආ) කියවනවිට ලිවීම.

3. මෙම පරීක්ෂණයෙන් සමත් වන අය සම්මුඛ පරීක්ෂණයකටද, පෙනී සිටිය යුතුයි.

4. පරීක්ෂණාදිය සඳහා පැමිණෙන ළමයින්ගේ වියදම් රජයෙන් ගෙවනු නොලැබේ.

5. ලිඛිත පරීක්ෂණයට පෙනී සිටින සෑම ඉල්ලුම්කරුවෙක් විසින්ම, කලින් දන්වා ඇති පරිදි, මහා තැපැල් ස්ථානාධිපති තුමා විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත්‍රිකාවක් මගින් තමන්ගේ හැඳින්වීම ඔප්පුකර සිටිය යුතුයි. හැඳින්වීමේ පතක් ඉදිරිපත් නොකරන ඉල්ලුම්කරුවන්ට පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

6. මෙම ආයතනයට බඳවා ගන්නා ශිෂ්‍යයින් කර්මාන්ත පුහුණු වීමේ කාලයවූ 18 මාසය තුළදී මෙහි නේවාසිකව සිටිය යුතුයි. කෑම, ඇඳුම්, වෛද්‍ය පහසුකම් යනාදිය නොමිලයේ සපයනු ලැබේ. තවද, ඔවුන්ගේ සුළු වියදම් සඳහා, නේවාසයෙහි සිටින දිනකට ශත 10 බැගින් හා කර්මාන්ත ශාලාවේ වැඩ කරන පැයකට ශත 2 බැගින්ද ගෙවනු ලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තුවල හෝ වෙනත් ආයතනවල ඇතිවන පුහුණුවන්නන්ගේ ඇබෑර්තු, මෙහි උසස් ලෙස සමත් වන ආධුනික යින්ගෙන් පුරවනු ලැබේ. වැඩිදුර පුහුණුවක් ලබාදීම සඳහා හැකි සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ. එහෙත්, මෙහි පුහුණුවන සියල්ලන්වම රක්ෂා ලබාදීමට මෙම ආයතනය බැඳී නැති බව තරයේ සිතට ගත යුතුයි.

8. මෙහි ලබන මූලික පුහුණුවීමෙන් පසු, රජයේ දෙපාර්තමේන්තු වක වැඩිදුර පුහුණුවීම සඳහා පත්වුවහොත්, ඒ අය ඇවුරුදු කර්මාන්ත පුහුණුවන්නන් ලෙස දැනට රජයේ පඩි ක්‍රමය අනුව පැයකට ශත 17 බැගින් පඩි ලැබීමට සුදුසුවේ.

3-205—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), 1964.4.1 සිට 64.9.30 දක්වා ගඟේ වැලි ආදිය සැපයීම සඳහා 1964.3.24 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964.3.23 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1964 මාර්තු මස 6 වැනි දින,
කොළඹදී ය.

3-231—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ ඇති ජී. අයි. ඉතිරි වූ කැබලි හා ඇම්. එස්. පොලු ඉතිරි කැබලි මිලයට ගැනීම සඳහා වූ ටෙන්ඩර

කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ, ඇති ජී. අයි. ඉතිරිවූ කැබලි හොණ්ඩර 10 ක් සහ ඇම්. එස්. පොලු ඉතිරිවූ කැබලි හොණ්ඩර 10 ක් මිලයට ගැනීම සඳහා ටෙන්ඩර පත් 1964 මාර්තු 26 වැනිදා පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ. උක්ත ද්‍රව්‍යයන් ඉරිදා හා සෙනසුරාදා යන දිනයන්හිදී හැර සතියේ අනික් දිනවලදී පෙරවරු 9 සිට දවල් 12 දක්වාත් පස්වරු 1 සිට 4 දක්වාත් වැලිකඩ බන්ධනාගාරයේදී පරීක්‍ෂා කළ හැක.

2. ටෙන්ඩර් ෆෝර්ම සඳහා කොළඹ 9, බන්ධනාගාර මූලස්ථාන යෙහි රුපියල් 10 ක් තැන්පත් කොට ඒ සඳහා නිකුත් කෙරෙන රිසිට් පත ටෙන්ඩර් පතට ඇමිණිය යුතුයි. යම් ටෙන්ඩරයක් භාර ගත් බව ලිපියකින් දන්වා දින දහයක් (10) ඇතුළතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකි වී නම්, හෝ ඉවත් කර ගැනීමේ කාර්යය පැහැර හැරියේ නම් හෝ ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල රාජසන්තක කරනු ලැබේ. ටෙන්ඩර් පත් පිළිගත් බව දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවිණි නම්, හෝ එම ස්ථානයෙහි තබා ආවේ නම් හෝ ටෙන්ඩර් කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුනු සේ සළකා ගනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමෙන් පසුව තැන්පත් මුදල් ආපසු දෙනු ඇත.

3. ටෙන්ඩර්කරුවන් විසින් දෙන්නට කැමති මිල ගණන විකිණීමට ඇති ද්‍රව්‍ය තොගය සඳහාම වශයෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත ලියුම් කවරයක බහා වසා මුද්‍රා තබා පහත සඳහන් අයගේ ලිපිනයට ඉදිරිපත් කළ යුත්තේ ය. හැම කවරයකම වම්පස ඉහළම කොනේ " ජී. අයි. ඉතිරිවූ කැබලි හා ඇම්. එස්. පොලු ඉතිරි කැබලි මිලයට ගැනීම සඳහා වූ ටෙන්ඩර් පත " යනුවෙන් සඳහන් කළ යුතුය. මේ සඳහා මුද්‍රිත ෆෝර්ම නිකුත් කරනු නො ලැබේ.

4. කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ, බන්ධනාගාර කම්මාන්ත අධිකාරිගේ කාර්යාලයේදී 1964 මාර්තු 26 වැනිදා පෙරවරු 10.35 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ කරුණ පිළිබඳ අනික් අවැසි විස්තර පහත අත්සන් කරන අයගෙන් ලබා ගැනීමට පිළිවන.

ජෙ. කුමාරසවාමි,
වැඩ බලන බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

1964 පෙබරවාරි මස 26 වෙනිදා,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේදීය.

3-86—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### ලුණු මිදෙල්ල සිලින් ලෑලි සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැනැත් වෙත ඉහත සඳහන් බඩු සපයා කොළොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර, වෂී 1964 ක්වූ අප්‍රියෙල් මස 7 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් ලියා පදිංචි කළ තැපැලෙන් එවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දිය යුතුයි. පිට කවරයේ ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය සහ සේවයේ විස්තරද සඳහන් කොට ටෙන්ඩර් මණ්ඩලයේ ටෙන්ඩර් භාරගැනීමේ බලයලත් සභාපති තැනට භාරදිය යුතුයි.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය. ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලයි. වෂී 1964 ක්වූ අප්‍රියෙල් මස 3 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වෂී 1964 ක්වූ අප්‍රියෙල් මස 7 වැනි අඟහරුවාදා පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. මුතුබාලසූරියර්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
වැ. බ. ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1964 ක්වූ මාර්තු 6 වෙනි දින දීය.

3–142—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### මින්නේරිය ජල විදුලි ක්‍රමයේ විදුලි බල යන්ත්‍රය සවිකිරීම

1964. 2. 7 දරණ ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීම සම්බන්ධවයි. ඉහත සඳහන් ටෙන්ඩරය භාර ගන්නා අවසාන දිනය 1964 මැයි මස 5 වෙනි දින පූ. භා. 10.00 දක්වා කල් දමා ඇති බව ටෙන්ඩර් අයදුම්කරුවන්ට මෙයින් දැනුම් දෙමි.

ඇම්. මුතුබාලසූරියර්,
වැ. බ. විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540,
කොළඹ—10,
1964 මාර්තු මස 6 වෙනි දින.

3–143—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

මෙහි පහත සඳහන් වැඩ වෙනුවෙන් ටැන්ඩර් පත්‍ර අක්කරපත්තු අධ්‍යාපන කාර්යාලයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 මාර්තු මස 20 වැනි දින පස්වරු 2 දක්වා භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩෙහි විස්තර |
|---|---|
| අක්/ඔලුවිල් අක්කරෙයි ර.මු. මි. පාසැල | පංති කාමර තුනක් තැනීම. |

සංලක්ෂ්‍යය.—අක් = අක්කරපත්තු අධ්‍යාපන දිස්ත්‍රික්කය.

2. ටැන්ඩර් පෝර්ම 1964 මාර්තු 19 වැනි දින පස්වරු 2 දක්වා ලබාගත හැකිය. රුපියල් 8,000කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද, එසේ නැතහොත් රුපියල් 8,000කට හෝ ඊට වැඩි ගණනකට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේද, ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රුපියල් 8,000කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ පිළිගත් සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමූපකාර සමිති, එක් එක් වැඩය සඳහා රුපියල් 100ක් මඩකලපුවේ අධ්‍යාපන කාර්යාලයේ ඒ.සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට කුවිතාන්සියක් අක්කරපත්තුවේ අධ්‍යාපන නිලධාරි තුමන් වෙත ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් ආදිය භාරගනු නො ලැබේ.

3. ටැන්ඩර් මුදල් තැන්පත් කිරීමට උවමනා බල කඩදාසි අක්කරපත්තුවේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත යුතුය. මුදල් තැන්පත් කරන බල කඩදාසි නිකුත් කරනු ලබන්නේ දෙවෙනි ඡේදය යටතේ ඒ ඒ ප්‍රමාණවලට ලියා පදිංචි වූ බව ඔප්පු කළ හැකි අයට පමණක් බව දත යුතුයි.

4. දෙවෙනි ඡේදයේ ප්‍රකාර අක්කරපත්තු අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම දෙවෙනි පිටපතක් සමග ඉදිරිපත් කළ යුතුය. එතුමාගෙන් මේ පිළිබඳව සියලු විස්තර දැනගත හැකිවා පමණක් නොව, එම කාර්යාලයේදී සැලැස්මවල්ද බැලිය හැක. තැපැලෙන් එවන ටැන්ඩර් පත්‍ර ලියා පදිංචි කොට එවිය යුතුයි. ප්‍රාදේශිය ටැන්ඩර් ඉල්ලුම්කරුවන් ටැන්ඩර් පත්‍ර තැපැලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිත යන් විසින් කවරයෙහි පිට පැත්තේ නම සහ ලිපිනයද, සේවයේ විස්තරද දැක්වෙන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අක්කරපත්තුවේ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාලීය සහකාර තැන වෙත භාරදී, භාර දුන් බවට ලියවිල්ලක් එවලේම ලබාගත යුතුයි.

5. ටැන්ඩර් විවෘත කරනු ලබන්නේ 1964 මාර්තු 20 වැනි දින පස්වරු 2.30ට අක්කරපත්තු අධ්‍යාපන කාර්යාලයේදීය. ටැන්ඩර් පත්‍ර විවෘත කරන විට ටැන්ඩර් ඉල්ලුම්කරුවන්ට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ. ටැන්ඩර් පත්‍ර විවෘත කරන නිලධාරි තැන විසින් පැමිණ සිටින ටැන්ඩර් ඉල්ලුම්කරුවන්ට ටැන්ඩර් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ප්‍රමාණයන් කියවනු ලැබේ.

6. ඉල්ලුම්කරුවන් ටැන්ඩර් භාරගන්නා අවසාන දින සිට සති හයක් යනතුරු ඔවුන්ගේ ඉල්ලීම් විවෘතව තබා සිටිය යුතුයි.

7. අක්කරපත්තු අධ්‍යාපන කාර්යාලයේදී වැඩි විස්තර දැන ගැනීම හා ටැන්ඩර් ලියකියවිලි පරීක්ෂා කිරීමට පුළුවන.

8. ටැන්ඩර් ලබාගන්නා තැනැත්තා විසින් සේවයේ යොදවනු ලබන සියළුම සේවකයන් ලාංකිකයන් වියයුතුවා පමණක් නොව ඔවුන් වැඩ කරන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහ යක්ම ගත යුතුය. ලාංකිකවූ හා වැඩකරන ප්‍රදේශයෙහි වූ, සේවක යන් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම් තුමාගේ හා අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගේ අනුමැතිය හා අවසරය නොමැතිව එකී කොන්දේසිය කුඩ කිරීම කොන්ත්‍රාත්තුව අවලංගු වීමට හේතුවේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩකරන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයන් වැඩෙහි යෙදවීම තහනම්ය.

9. තවද ටැන්ඩර් ලබාගත් තැනැත්තා විසින් ස්වදේශීය සුදුසු උළු ලබා ගැනීමට නොහැකි බවට ගොඩනැගිලි පරීක්ෂක ඉංජිනේරු මහතාගෙන් සහතිකයක් ලබා මිස ගොඩනැගිලි වහලවල් සෙවිලි කිරීමට ස්වදේශීය උළුම ප්‍රයෝජනයට ගත යුතුයි. උළුවල සුදුසුකම් ගැන පරීක්ෂණයක් පැවැත්වීමට උවමනා නම් එවැනි පරීක්ෂණයක් සපයන්නා විසින් තමන්ගේ වියදමින් ලංකාවේ රසායනික සහ කාර්මික පරීක්ෂණාගාරය මගින් ලබාගත හැක. ටෙන්ඩර ලබාගත් තැනැත්තන් තමන් විසින් යම් ගොඩනැගිල්ලක් සඳහා පාවිච්චි කිරීමට බලාපොරොත්තුවන උළුවල සැම්පලයක් එහි ඇති සුදුසු තත්වය හා සැදුම ගැන ලංකාවේ රසායනික හා කාර්මික පරීක්ෂණ ගාරයෙන් සහතිකයක් සමග ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය,
අක්කරපත්තුව.

3–169—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් අංගොඩ උන රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1964 අප්‍රේල් 21 වැනි කුජ දා පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7 හි පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල, පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන විසින් 1964 අප්‍රේල් 3 වැනි සිකුරාදා පස්වරු 4 වනතෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන කර්මාන්තයන් සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 100ක මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් කොළඹ, ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශ කාර්යාලයේ අංක 155 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ සිටින සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට භාරදිය හැකිය. සේවයේ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය ද කවරයේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩරය භාරගත් බවට ඉහත සඳහන් නිලධාරිතැන කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහිදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂාකර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

5. වැඩය පිළිබඳ තවදුරටත් විස්තර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන.

තැ : පෙ : 1434,
කොළඹ 7.
1964. 2. 26 වෙනි දා.

3–110—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් මැදගම රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1964 අප්‍රේල් 21 වැනි කුජ දා පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7 හි පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල, පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන විසින් 1964 අප්‍රේල් 3 වැනි සිකුරාදා පස්වරු 4 වනතෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන කර්මාන්තයන් සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 100ක මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් කොළඹ, ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශ කාර්යාලයේ අංක 155 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ සිටින සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට භාරදිය හැකිය. සේවයේ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය ද කවරයේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩරය භාරගත් බවට ඉහත සඳහන් නිලධාරිතැන කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහිදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂාකර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

5. වැඩය පිළිබඳ තවදුරටත් විස්තර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන.

තැ : පෙ : 1434,
කොළඹ 7.
1964. 2. 26 වෙනි දා.

3–111—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කොළඹ රෝහල් මණ්ඩලය

### සේවයට අයෝග්‍ය මෝටර්රථ මිළයට ගැනීම

කොළඹ රෝහල් මණ්ඩලයේ තිබෙන සේවයට අයෝග්‍ය පහත සඳහන් මෝටර් රථය මිළයට ගැනීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1964 මාර්තු මස 16 වෙනි දින පෙරවරු 10 වන තෙක් කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී විසින් භාරගනු ලැබේ. විකිණීමට තිබෙන මෝටර් රථය පහතින් දක්වේ. එම මෝටර් රථය පහත දැක්වෙන ස්ථානයෙහි දැකීමට තබා ඇත. කාර්යාල ඇර තබා ඇති කාලයන් තුළදී, දා සොයිසා කාන්තා රෝහලේ වෛද්‍ය අධිකාරීගේ අවසර පිට එම රථය පරීක්ෂාකර බැලීමට පුළුවන:—

(1) ඔස්ටින් ගිලන් රථය—අංකය : සී.එල් 7603—ද සොයිසා කාන්තා රෝහල.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, රුපියල් 100 ක මුදලක් කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී නමින් කච්චේරියක තැන්පත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කර, 1964 මාර්තු 13 වැනි සඳුදා දවල් 12 ට පෙර ටෙන්ඩර් ෆෝර්ම කොළඹ රෝහල් මණ්ඩලයේ මුදල් පිළිබඳ කාර්යාලයෙන් ලබාගත හැක.

3. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙලවරේ "සේවයට අයෝග්‍ය මෝටර් රථ මිලයට ගැනීම සඳහා ටෙන්ඩර්" කියා සඳහන් කර, කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරීගේ ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස පහත කෙලවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුය.

4. ටෙන්ඩර් කරුවන්ට, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට පුළුවන. පළමුවෙනි ඡේදයේ සඳහන් යටකී දිනයේ වේලාව පසුවූ වහාම, ටෙන්ඩර්පත්‍රකරුවන්ගේ නම් සහ ඉදිරිපත් කළ මිල ගණන් කියවනු ලැබේ.

5. ටෙන්ඩර් විවෘත කළ පසු, දින තුනක් ඇතුළත සම්පූර්ණ මුදල ගෙවා රථවාහනය ගෙන ගිය යුතුය. එසේ ගෙන නොගිය හොත් ඔවුන්ගේ ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ කොටසක් වශයෙන් භාරගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය, කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී වෙත තබාගනු ලැබේ.

ඇම්. ජේ. ද ඇස්. ජයසේකර,
අධිකාරී,
කොළඹ රෝහල් මණ්ඩලය.

කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී කාර්යාලය,
මහාරෝග්‍යශාලාව,
කොළඹ,
1964 පෙබරවාරි මස 29 වෙනි දින දීය.

3–206—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1964 අප්‍රේල් 10 වැනි දින සිට 1964 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා, ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර, අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් විදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු බස්නාහිර පළාතේ ආයතනයන් සඳහා මෙම කාර්යාලයෙන් ද අනිත් පළාත්වල ආයතනයන් සඳහා ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **චක්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැළකිය යුතු කාලයකට පළමුව තම චක්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

චක්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහාලේකම් කාර්යාලය, ගාලු මුවදෙර, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතු වාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාට ගණකාධිකාරි මහතාට (සැපයීම සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචිකළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දුපත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නාලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේ ය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන් වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටු රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇනොන්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක් ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙනුවට.

1964.2.29,

කොළඹ, ගාලුමුවදෙර මහලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී ය.

### උපලේඛනය

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් තැන්පත් මුදල<br>රුපියල් | 3<br>ඇප මුදල<br>රුපියල් | 4<br>මසකට රෙදි සේදිය යුතු වාර ගණන | 5<br>මසකට රෙදි සේදිය යුතු කැලි ගණන සාමාන්‍ය | 6<br>ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| උතුරු කොළඹ මහ රෝහල, රාගම | | | | | |
| 1 වෙනි කොටස, වාට්ටු අංක 1, 5, 6, 8, 9, 12, 13, 14, 15, 16; අසාධ්‍ය (ක්‍රොනික්) වාට්ටු අංක 1, 2, 3, 4; බාහිර ලෙඩුන්ගේ දෙපාර්තමේන්තුව, ඇක්ස්රේ දෙපාර්තමේන්තුව, රසායනාගාරය, මුළුතැන්ගෙය, හෙදි නිවාසය හා කායශාලය | 100 ... | 200 ... | 10 ... | 21,160 ... | 1964.3.31, පෙරවරු 10ට |

## මෝටර් වාහන මිළදී ගැනීම

මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් මෝටර් වාහන මිළදී ගෙන ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 මාර්තු මස 24 වැනි අඟහරුවාදා පෙ. ව. 9.30 දක්වා කොළඹ 5, කිරුළ පාරේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සර්වෙයර් ජනරාල් තැන විසින් භාරගනු ලැබේ :—

විලීස් යුනිවර්සල් ජීප් රථය අංක ඊ. වයි. 8676
විලීස් යුනිවර්සල් ජීප් රථය අංක 1 ශ්‍රී 962
විලීස් මගින් හා බඩු ගෙන යන රථය අංක 33 ශ්‍රී 1582
ජීප් රථවලට අමුණන විලීස් ස්පෙන් ට්‍රේලරය අංක ඊආර් 1306.

2. මෙම රථ දැන් පවතින තත්ත්වයේ විකිණීමට පිරිනැමෙනවා ඇත. දෙපාර්තමේන්තුවේ ප්‍රවාහණ නිලධාරිතැනගේ අවසරය පිට කාර්යාල කටයුතු කෙරෙන වේලාව ඇතුළත මෙම කාර්යාලයේදී ඒවා පරීක්ෂා කිරීමට පුළුවන.

3. එක් එක් රථයට ටෙන්ඩර් කරණු ලබන ගණන වෙන් වෙන් වශයෙන් පෙන්නුම් කළ යුතුයි. පහත සඳහන් ලිපිනයට රු. 50 ක මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, අනු පිටපතක්ද සමග ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. යම් ටෙන්ඩර් කරුවකුගේ ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් ලියවිල්ලකින් ඔහුට ලැබ දින පහක් ඇතුළත ඔහු ටෙන්ඩර් කළ ප්‍රමාණය ගෙවීමට ප්‍රතික්ෂේප කළ හොත් හෝ අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල ඔහුට අහිමිවන අතර රථය වෙන ටෙන්ඩර් කරුවකුට පිරිනමනවා ඇත. තවද ඔහුගේ නම රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයටද ඇතුළත් කිරීමකට වුවද යටත් විය හැක. පිළිගත් ටෙන්ඩර්කරු සම්පූර්ණ මුදල ගෙවා තෙදිනක් ඇතුළත දැන් තිබෙන ඉඩමෙන් රථය ඉවත් කළ යුතුයි.

4. 1964 මාර්තු මස 23 වැනි සඳු දින අ. භා. 4 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනවා ඇත.

5. නියෝජ්‍ය සර්වෙයර් ජනරාල් තැනගේ කාමරයේදී 1964 මාර්තු මස 24 වැනි අඟහරුවාදා පෙ. ව. 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ අවස්ථාවේදී පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

7. ටෙන්ඩර් වැසූ දින සිට සති 4 ක් කාලය තුල ටෙන්ඩර්කරුවන් විසින් පිරිනමන ලද ගණන් විවෘතව තබාගන්නා ලෙස බලාපොරොත්තු වනවා ඇත.

8. "මෝටර් රථ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සලකුණුකොට සීල් කරණ ලද ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් කොළඹ, තැ. පෙ. 506, මූලස්ථාන මිනින්දෝරු අධිකාරි තැන්පත් සී. වන්නියසිංහම් මහතාට ලැබෙන ලෙස එවිය යුතුයි.

9. රෙජිස්ටර් තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර එවීමට අකැමැති අය පුද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයින් මගින් හෝ ඒවා (සේවයේ තොරතුරු හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය කවරයේ සඳහන් කොට) මූලස්ථාන මිනින්දෝරු අධිකාරි තැන්පත් සී. වන්නියසිංහම් මහතාට භාරදී කුවිතාන්සියක් ලබාගත යුතුය.

10. ටෙන්ඩර් කරණ ලද ගණන් ආකෘති පත්‍රයේ ඉලක්කම් වලින් ලියා වචන වලින්ද නැවත ලිවිය යුතුයි. වචන හා/හෝ ඉලක්කම් අතර යම්කිසි වෙනසක් තිබුණොත් ටෙන්ඩර් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ. ටෙන්ඩර් පත්‍රවල ඇති වන්නට හැකි සියළුම වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබීමෙන් සහතික කළ යුතුය.

11. තැන්පත් කළ ටෙන්ඩර් මුදල 3 වැනි ඡේදයේ කොන්දේසි වලට ඉඩ ඇතිව ආපසු ගෙවනු ලැබේ.

12. යම්කිසි ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර ප්‍රතික්ෂෙප කිරීමද, ටෙන්ඩරයකින් යම්කිසි කොටසක් භාරගැනීමද රජය වෙතම පැවරී ඇති අවිවාදන්මක අයිතියකි.

13. වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් කොළඹ 5, කිරුළ පාරේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රවාහණ නිලධාරි තැනගෙන් ලබාගත හැක.

ස. කාර්තිගේසු,
සර්වෙයර් ජනරාල්.

1964 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ, තැ. පෙ. 506, ශිනුම් අංශයේදීය.

3–249—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

අම්පාරේ දෙවෙනි ශ්‍රෙණියේ ඩිපෝවේ ගොඩනැගිලි පාරවල් සහ අංගනයන් තැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

යථෝක්ත ශීර්ෂය යටතේ 1964.2.14 වෙනිදා මෙම ගැසට් පතෙහි පළ වූ ටෙන්ඩර් දැන්වීම සම්බන්ධවයි. එකී ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය 1964.3.18 වෙනිදා තෙක් දීර්ඝ කොට ඇති බව ටෙන්ඩර් පත් එවීමට කැමති භවතුන් වෙත මෙයින් දන්වමි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1964 රේ පෙබරවාරි මස 29 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේදී ය.

3–234—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

රසායනාගාරවලට අවශ්‍ය දෑ සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

ඉහත සඳහන් දෑ සැපයීමට ම විසින් ප්‍රාදේශික සපයන්නන්ගෙන් මිළ ගණන් බාරගනු ලැබේ.

මිළ ගණන් කවරවල බහා පිට පැත්තේ වම් පස ඉහළ කෙළවරේ " රසායනාගාරවලට අවශ්‍ය දෑ සැපයීමට මිළ ගණන් " යනුවෙන් සඳහන් කර කොළඹ 5, නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ සභාපතිට 1964 අප්‍රියෙල් මස 15 වැනි බදාදා පස්වරු 2 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

වැඩි විස්තර සහ බඩු ලැයිස්තු මේ කාර්යාලයේ මාණ්ඩලික සහකාරගෙන් ලබාගත හැක.

ඇම්. බී. සල්මන්,
සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය,
කොළඹ 5.
1964 මාර්තු 2 වැනි දින.

3–207—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## ඉහළ කලංකුට්ටිය—අමුණුගම පාර දියුණු කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීමයි—අනුරාධපුර දිස්ත්‍රික්කය

ඉහළ කලං කුට්ටිය—අමුනුගම පාර දියුණු කිරීම සඳහා, අනුරාධපුර දිසාපතිතුමා විසින් 1964 අප්‍රේල් මස 7 වෙනි දින පෙ. ව. 10 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 7 වෙනි දින ප. ව. 2.30 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී කැමති නම් ටෙන්ඩර් කරුවනටද පැමිණ සිටිය හැක.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ 1964 මාර්තු මස 31 වෙනි දින දහවල් 12 දක්වා අනුරාධපුර දිසාපති තුමා ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තවය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර භාණ්ඩාගාරයේ හෝ කච්චේරියක රුපියල් 50 ක මුදලක් තැන්පත් කොට ඒ බවට ලදු පතක් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් කරු විසින් පහත සඳහන් කරුණු දැක්විය යුතුයි.

(අ) ඔහු පදිංචිව සිටින ගම්මුලාදෑණි කොට්ඨාශය, ප්‍රා. ආ. නි. කොට්ඨාශය සහ දිස්ත්‍රික්කය.

(ආ) වාරිමාර්ග, ඉඩම් සංවර්ධන හා රජයේ වැඩ වැනි රජයේ දෙපාර්තමේන්තුවක හෝ කච්චේරියක කොන්ත්‍රාත් වැඩ ඔහු විසින් භාර ගෙන කර තිබේ ද යන වග.

ඉහත සඳහන් (ආ) අදාල වන්නේ නම් ඔහුගේ හැකියාව ගැන අදාල දෙපාර්තමේන්තුවෙන් ලබාගත් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

5. මේ සම්බන්ධව වැඩි විස්තර අනුරාධපුර දිසාපති තුමාගෙන් දැනගත හැක.

ග. මූ. සු. ෆාරුක්,
දිසාපති වෙනුවට,
අනුරාධපුර දිස්ත්‍රික්කය.

1964.2.26,
දිසාපති කායාලය,
අනුරාධපුරය.

3–109—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### රට අඟුරු ගෙන්වීම සඳහා නෑව්භාස්තු කැඳවීම

1964 අප්‍රියෙල් මස මුල් භාගයේ සිට 1964 සැප්තැම්බර් මස 30 වැනිදායින් අවසන් වන කාල සීමාව තුළ රට අඟුරු ටොන් 100,000ක් ලොරෙන්සෝ මාර්කිස් වරායේ සිට ගෙන ඒම පිළිබඳ රජයේ ගමනාගමන අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 මාර්තු මස 13 වැනි සිකුරාදා පූ. භා. 11 වනතුරු ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1964 මාර්තු මස 12 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා දුම්රිය ගබඩා කාර්යාලයෙන් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1964. 3. 4 වැනි දින,
කොළඹදීය.

3–286—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ටොන් පහේ ඩීසල් ලොරි 4 ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 1 වැනි බදාදා පෙරවරු 11.00 වන තෙක් බාරගනු ලැබේ. 1964 අප්‍රේල් මස 2 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 ට අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටිය හැක.

2. රත්මලානේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන ගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය.

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන : චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති සහ,

(ඈ) සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමුපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 මාර්තු මස 31 වැනි අඟහරුවාද දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. " ලාංකික කරන ලද මූලාංග වලින් " එනම්, ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ඇස්තෝනියාව, හන්ගේරියාව, ලැට්වියාව, ලිතුඅනියාව, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, සෝවියට් සමාජ වාදී එක්සත් සමූහාණ්ඩුව සහ යුගෝස්ලේවියා ආදී රටවලින් බඩු ගෙන්වා සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද පොදු ආනයන බල පත්‍රයක් ඇති ලියා පදිංචි කළ ලාංකික වෙළඳුන් විය යුතුය.

වී. අරසරත්නම්.
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1.
1964 පෙබරවාරි මස 28 වැනි දින.

–238—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ තුරඟ පිට්ටියේ කර්මාන්ත ප්‍රදර්ශණ භූමියෙහි පෙර සකස් කළ වානේ ගොඩනැගිල්ලක් සපයා ඉදි කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස් හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 8 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් පෙදෙසෙහි කර්මාන්ත ප්‍රදර්ශණය භාර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන ගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැළැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 මාර්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 175,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

5. 1964 මාර්තු 20 වෙනි දින සිට අප්‍රේල් මස 7 වෙනි දින අ. භා. 4.30 වන තෙක් ප්‍රමාදවූ දිනකට රු. 25 ක් බැගින් ගෙවීමෙන් ද අවශ්‍ය අයට ටෙන්ඩර් පත් ලබාගත හැක. මෙම මුදල ආපසු නොගෙවනු ඇත.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

1964 මාර්තු මස 2 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය.

3–235—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසි කිරීම

නිකවැරටිය අඩවියේ නොයෙක් ස්ථානවල ඇති හල්මිල්ල ඉරූ දැව, හල්මිල්ල, මිල්ල, වැවරණ කඳන් හා ආයුධ වලින් සමන්විත ද්‍රව්‍ය තොග හතක් 1964 මාර්තු මස 16 වන දින උදය 10 ට එම අඩවියේ කැලෑ කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව පරීක්ෂා කර බැලීම පිණිස අඩවි කැලෑ නිලධාරි හමුවී තිබෙන ස්ථාන දැන ගත හැකිය. වැඩි විස්තර සඳහා වයඹ දිසා කැලෑ කාර්යාලයෙන් විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරී.

තැ. පෙ. 10,
කුරුණෑගල.
64. 2. 19.

3–1000—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රසිද්ධ වෙන්දේසියක්

පාවිච්චි කරණලද නිල ඇඳුම්, හම් සපත්තු, වැහි කබා, මදුරු දැල්, ගුදිරි, ඇල තොප්පි සහ ඇඳුම් කට්ටල් පෙට්ටි යනාදී වෙනත් බඩු තොගයක් වෂී 1964 මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා උදේ 10ට බම්බලපිටියේ හැව්ලොක් පාරේ පිහිටි පොලිස් ශේවා මධ්‍යස්ථාන යේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකිණීම සඳහා ඇති බඩු සතියේ දිනවල පෙරවරු 9 සිට 4.30 දක්වාද, සෙනසුරාදා දිනවල පෙරවරු 9 සිට දහවල් 1 දක්වාද බැලිය හැක.

3. වෙන්දේසිය අවසානයේ දී බඩු ගෙන යැමට පෙර බඩුවල සම්පූර්ණ මුදල ගෙවිය යුතුය.

එච්. ජී. බෞඩ්වින්,
සහකාර පොලිස් අධිකාරී ශේවා
මධ්‍යස්ථානය.

පොලිස් ශේවා මධ්‍යස්ථාන කායාීලය,
1964 පෙබරවාරි මස 24 වෙනි දින.

3–257—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සහතික මිලට ගවයින් විකිණීමට අවස්ථාවක්

ගව හිමියන්ගේ බෝ කිරීමට නුසුදුසු සහ වැඩිපුර සතුන් සහතික මිලකට විකිණීමට අවස්ථාවක් ලබාදීම පිණිස, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් විස්තර අනුව මසට සුදුසු එළ ගවයින් මිල දී ගනු ලැබේ :—

1. කොළඹ, කොම්පඤ්ඤවීදියේ රජයේ පශු වෛද්‍යවරයා වෙත බාර දෙන්නේ නම් හෝ මුදල් ගෙවා, ඔහු වෙත, කොළඹ කොටුවේ දුම්රිය ස්ථානාධිපති භාරේ කොටුවේ දුම්රිය ස්ථානය වෙත එවන්නේ නම් හෝ— ... ජීවබර රාත්තලකට ශත 32යි

කොළඹ සිට දුර ප්‍රමාණය අනුව ඕනෑම මහා මාර්ගයක් සමීපයකදී, දෙපාර්තමේන්තුව මිලදී ගන්නා ගවයින්ට ගෙවන මුදල් :—

2. සැතපුම් 25 දක්වා ... ... ජීවබර රාත්තලකට ශත 30යි
3. සැතපුම් 25 සිට 50 දක්වා ... ... ජීවබර රාත්තලකට ශත 29
4. සැතපුම් 50 සිට 75 දක්වා ... ... ජීවබර රාත්තලකට ශත 28යි
5. සැතපුම් 75 සිට 100 දක්වා ... ජීවබර රාත්තලකට ශත 27යි
6. සැතපුම් 100 ට වැඩි දුර ප්‍රමාණයක දී ... ජීවබර රාත්තලකට ශත 26යි

1 වන හා 2 වැනි අංක දරණ මිල දී ගැනීම් පිළිබඳ ව, කොළඹ, කොම්පඤ්ඤ වීදියේ රජයේ පශු වෛද්‍යවරයා අමතන්න.

අනෙක් මිල දී ගැනීම් පිළිබඳ ව ඔබ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයා විමසන්න.

වැඩි විස්තර සඳහා, " කොළඹ, තැ. පෙ. 536, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලනය හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ " අමතන්න.

3–14—64.3.6 දින අංක 13,974 දරන ගැසට් පත්‍රය

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | | ... | ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|---|---|---|
| එක් කොටසක් | ... | ... | ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් | | ... | ... | 17 50 | ... | 23 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් | | ... | ... | 25 0 | ... | 33 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් | ... | ... | ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් | ... | ... | ... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් | ... | | ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් | ... | | ... | 0 30 | ... | 0 15 |

**දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වැලව්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි